## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2021/02/01 |
|---|---|---|

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | කේ. සිවනන්දසෙල්වම් මයා.<br>අංක 10, කුඩා ඔය,<br>හැටන්. |
| වගඋත්තරකාර පාර්ශවය | : | 01. ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල.<br><br>02. සහකාර ලේකම්,<br>විදුහල්පති සේවා අංශය,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. |
| <u>පැමිණිලි අංකය</u> | : | **<u>HRC/1144/15</u>** |

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු විසින් 2015-03-30 දිනැතිව (දෙමළ බසින්) ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මගින් සහ එම පැමිණිල්ලට අදාලව පසුව ඉදිරිපත් කරන ලිඛිත හා වාචික කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කර ඇත්තේ, ඒ වන විට තමා ලක්ෂපාන අංක 02 දෙමළ විදුහලේ වැඩ බලන විදුහල්පති ලෙස සේවය කරමින් සිටි බවත්, 2012 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වසර 05කට වැඩි කාලයක් විදුහල්පතිවරුන් ලෙස වැඩ බැලීමට පත් කළ ගුරුභවතුන් 2013-01-03 දිනැතිව නිකුත් කර ඇති චක්‍රලේඛයක් මගින් විදුහල්පති ශ්‍රේණියේ 2 පංතියේ II ශ්‍රේණියට පත්කිරීමට කටයුතු කර ඇති බවත්, ඒ වන විට තමා වසර 14කට වැඩි කාලයක් වැඩ බලන විදුහල්පතිවරයකු ලෙස සේවය කර තිබූ නමුත්, අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදීත් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව තමාට හිමි විදුහල්පති ශ්‍රේණියට අන්තර්ග්‍රහණයට වීමට තිබූ අවස්ථාව හැටන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ අතපසුවීමක් මගින් අහිමි වී ගිය බවත්ය.

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර ඇතත්, පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් මේ සම්බන්ධයෙන් තමන් වෙත


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

සහනයක් සලසා දීමට වගඋත්තරකරුවන් කටයුතු කර නොමැති බවත්, මෙම තත්ත්වය තුළ තමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙසත් ඉල්ලා ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ලට අදාලව වගඋත්තරකරු ලෙස සඳහන් කර ඇති ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් අතිරේක ලේකම් එච්. යූ. ප්‍රේමතිලක මහතා 2017-08-10 දාතමින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කර ඇත්තේ, අමප/12/1101/530/035 සහ 2012-08-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අධිස්වේක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා 2012/2013 වර්ෂ වල පාසල් වල විදුහල්පති තනතුරු වල වැඩ බලන ගුරුසේවයේ නිලධාරින්ගේ තොරතුරු කලාප අධ්‍යාපන කාර්යාල වෙතින් කැඳවා ඇති බවත්, එසේ කැඳවන ලද තොරතුරු අනුව තමාගේ අංක ED/04/60/01/18 හා 2012-09-19 දිනැතිව සුදුසුකම් සපුරන ලද නිලධාරින් සඳහා සම්මුඛ පරීක්ෂණ වලට සහභාගි වන ලෙසට දැනුම් දී ඇති බවත්ය.

ඒ අනුව සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරන ලද සුදුසුකම් සහ ලකුණු ලබා දීමේ පටිපාටිය අනුගමනය කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමප/11/2120/530/015-11 හා 2012 පෙබරවාරි 09 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එවකට පැවැති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 979/2009 හා 212/2012 සඳහා ලත් නඩු තීන්දු වලටද අනුකූලව අදාල පත්වීම් සඳහා නියමිත පුරප්පාඩු සංඛ්‍යාව වෙන් කල පසු ඉතිරිවන පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනීමට කටයුතු කර ඇති බවත් සඳහන් කර ඇත. නමුත් මෙම පැමිණිලිකරු වන සිවනන්දසෙල්වම් මහතාගේ තොරතුරු හැටන් කලාප අධ්‍යාපන කාර්යාලය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දී නොමැති බවත්, ඔහුගේ නම අතපසු වීමකින් අදාල ලේඛනයට ඇතුලත් කර නොමැති බවට හැටන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අංක මප/අධ්‍යා/සාපා/13/21 හා 2014-10-15 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරු තම අභියාචනය ඉදිරිපත් කරන විටත් අධිස්වේක පදනම මත විදුහල්පති ශ්‍රේණියට බඳවා ගැනීම් සිදු කර අවසන් කර තිබූ බවත්, ඒ සම්බන්ධයෙන් සිවනන්දසෙල්වම් මහතා වෙත තමාගේ අංක ED/04/60/01/18- අභියාචනා හා 2015-02-02 දිනැති ලිපිය මගින් දැනුම් දීමට කටයුතු කර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

විමර්ශනය :-

පැමිණිල්ලට අදාලව සිදුකරන ලද 2017-08-11 දිනැති පරීක්ෂණයේදී පැමිණිලිකරුට සහනයක් සලසා දී පැමිණිල්ල සමථයට පත්වීමට ඇති හැකියාව පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය වෙතින් කරුණු විමසා සිටීමේදී විෂයගත කාරණයට අදාලව පවතින ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන්

පැමිණිලිකරු වෙත සහනයක් සලසා දී පැමිණිල්ල සමථයකට පත් විමට හැකියාවක් නොමැති බව වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රතිචාරය වී ඇත.

මෙම තත්ත්වය තුල පැමිණිල්ලට අදාලව පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු සියල්ල අවධානයට ලක් කිරිමේදී පැමිණිලිකරු විසින් තම පැමිණිල්ල මගින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව 2012 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් වැඩබලන විදුහල්පතිවරුන් විදුහල්පති ශ්‍රේණියේ 2 පංතියේ II ශ්‍රේණියට බඳවා ගැනිමට අදාලව නිකුත් කර ඇති චක්‍රලේඛය මගින් පැමිණිලිකරු වෙතද එම විදුහල්පති තනතුරක් ලබා ගැනීම සඳහා අවස්ථාවක් තිබූ බව නිරීක්ෂණය වන අතර. පැමිණිලිකරු ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබූ බවද නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය සඳහන් කරන ආකාරයට ඒ සඳහා වන සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා පැමිණිලිකරුගේ විස්තර හැටන් කලාප අධ්‍යාපන කාර්යාලය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා නොදීම සහ එමගින් සිවනන්දසෙල්වම් මහතා වෙත අදාල සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් විමට හැකියාවක් නොමැති වීම මත සහ ඔහු ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන විට අදාල පුරප්පාඩු සම්පූර්ණ වීම මත ඔහුට අවස්ථාවක් ලබා දීමට හැකියාවක් නොමැති බව සඳහන් කිරිම මගින් හැටන් කලාප අධ්‍යාපන කාර්යාල නිලධාරින් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාල බලධාරින් වෙතින් පැමිණිලිකරු වෙත සිදුව ඇති අගතියට සාධාරණයක් වී නොමැති බව නිරීක්ෂණය වේ.

තවද මධ්‍යම පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2014-10-15 දිනැතිව මධ්‍යම පලාත් අධ්‍යාපන ලේකම් මගින් අධ්‍යාපන ලේකම්වරයා වෙත යොමු කර ඇති ලිපියේ අන්තර්ගතයට අනුව සහ 2014-09-05 දිනැතිව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හැටන් විසින් අධ්‍යාපන ලේකම් වෙත යොමු කර ඇති ලිපියේ අන්තර්ගත කරුණු වලට අනුවද පැමිණිලිකරු වන සිවනන්දන්සෙල්වම් මහතාට අදාල විදුහල්පති තනතුර සඳහා සුදුසුකම් පැවැති බවට නිර්දේශ කර ඇත.

විශේෂයෙන්ම පැමිණිලිකරු මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරිමෙන් පසුව ද ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් සහනයක් සලසා ගන්නා ලෙස මෙම පැමිණිලිකරු වෙත දන්වා ඇති බවද අනාවරණය වේ. ඒ අනුව මෙම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව පැමිණිල්ලේ විෂයගත කාරණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම අනුව අදාල විදුහල්පති තනතුරට පත් කිරිම සඳහා පැමිණිලිකරු වන සිවනන්දසෙල්වම් මහතා හට අවශ්‍ය සුදුසුකම් නොපැවති බව සඳහන් කරන නොකරන. හැටන් කලාප අධ්‍යාපන කාර්යාලයේ අතපසුවීමක් හේතුවෙන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට කටයුතු නොකිරිම පිළිබඳව සඳහන් කර ඇත.

**නිගමනය :-**

ඒ අනුව පැමිණිලිකරු තම පැමිණිල්ල සහ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන වැඩිමනක් කරුණු දැක්වීම් අනුව හැටන් කලාප කාර්යාලයේ නොසැලකිලිමත්කම හේතුවෙන් පැමිණිලිකරු අගතියට

පත්ව ඇති බව පැහැදිලි වේ. එනම්, විදුහල්පති සේවයේ 2 පංතියේ II ශ්‍රේණිය සඳහා වැඩ බලන විදුහල්පතිවරුන් පත් කිරීමේදී හැටන් කලාප අධ්‍යාපන කාර්යාලයේ අතපසුවීම හේතුවෙන් කේ. සිවනන්දසෙල්වම් මහතා වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) මගින් සහතික කර දී ඇති "නීතිය ක්‍රියාත්මක කිරීම හා නීතියේ රැකවරණය සර්වසාධාරණ විය යුත්තේය" බවට වන ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරමි.

නිර්දේශය :-

01. මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයට අනුව පැමිණිලිකරු වන කේ. සිවනන්දම්සෙල්වම් මහතාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කර ඇති බවට අනාවරණය වී ඇති බැවින් පැමිණිලිකරු වෙත අදාළ පත්වීම් ලබා දීම සඳහා ඉහත සඳහන් කර ඇති චක්‍රලේඛය පරිදි අදාළ සුදුසුකම් පරීක්ෂා කර ඒ වන විට ඔහු අදාළ විදුහල්පති තනතුර සඳහා සුදුසුකම් සපුරන්නේ නම් 2013 වර්ෂයේ සිට අදාළ විදුහල්පති තනතුර සඳහා ඔහුව පත් කිරීමටත් එම වර්ෂයේ සිට මේ දක්වා ඒ සඳහා ඔහුට හිමිවන හිඟ වැටුප් හා දීමනා ආදියද ලබා දීමට කටයුතු කිරීමටත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. හැටන් කලාප කාර්යාලය මගින් සිදුව ඇති ඉහත අතපසුවීම සම්බන්ධයෙන් සොයා බලා සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතු බවටද ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙයින් දන්වා සිටිමි.

2021.03.26 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anushya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

වෛ.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/